# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No: 10120

ෆැක්ස් / தொலைநகல / Fax: 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone: 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site: www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail: dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO: 449 /2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No: / 2024

දිනය / திக / Date: 14/03/2024 පැය 1355

**මාධ්‍ය නිවේදනය**

**ද්විත්ව මනුෂ්‍ය ඝාතනයක් - පෙරියනීලාවනි පොලිස් වසම.**

2024.03.14 වන අද දින උදෑසන කාලයේ පෙරියනීලාවනි පොලිස් වසමේ පාක්කියතුසාලියා පාර ප්‍රදේශයේ නිවසක සිදු වූ ද්විත්ව මනුෂ්‍ය ඝාතනයක් සම්බන්ධයෙන් පෙරියනීලාවනි පොලිසිය වෙත ලද පැමිණිල්ලක් මත සිදු කල විමර්ශනයේදී පියා විසින් තම දියණියගේ හා පුතාගේ ගෙළ කපා ඝාතනය කර ඇති බවට අනාවරණය වී ඇත.

**මරණකරු වයස අවුරුදු 29 ක් හා මරණකාරිය වයස අවුරුදු 15 ක් වන පෙරියනීලාවනි ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

මෙම ඝාතනයෙන් පසු සැකකාර පියාද සියදිවි හානි කර ගැනීම සඳහා ගෙළ කපා ගෙන ඇති අතර, ඔහු මේ වන විට කල්මුණ රෝහලේ ප්‍රතිකාර ලබයි. සැකකරුගේ බිරිඳ මීට වසරකට පමණ පෙර මිය ගොස් ඇති බවත්, ඝාතනයට ලක් වූ දරුවන් උපතින්ම කතා කිරීමට නොහැකි දරුවන් බවටත් වැඩිදුර විමර්ශනයේදී අනාවරණය වී ඇත.

මෘත ශරීර මහේස්ත්‍රාත් පරීක්ෂණයෙන් පසු පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා අම්පාර රෝහල වෙත රැගෙන යාමට නියමිතය. පෙරියනීලාවනි පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**